# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2021 මාර්තු මස 05 වන දින

## II වන කොටස

## අතිරේකය

(2021.03.08 දින නිකුත් කරන ලදී)


### මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන)

**2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

මුදල් අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 6.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තියේ (ඉ) සහ (ඊ) ඡේද සංශෝධනය කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතියේ බලපෑම වනුයේ -

(අ) (ඉ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති ඇපකර සීමාව සියයට 15 දක්වා වැඩි කිරීම මගින්; සහ

(ආ) දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව පවතින ණය ඉලක්කය 2030 වසර දක්වා ඉදිරියට ගෙනයාම මගින්,

වගකීම් සහිත මූල්‍ය කළමනාකරණයට පාදක වන පරමාර්ථ ප්‍රතිශෝධනය කිරීම වේ.

එල්.ඩී.—ඕ. 7/2021

**2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය

**1.** මේ පනත 2021 අංක    දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2003 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ “සියයට දහයක්” යන වචන ඉවත් කර ඒ වෙනුවට “සියයට පහළොවක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ “2020 ජනවාරි මස 1 වන දිනයෙන්”, යන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට “2030 ජනවාරි මස 1 වන දිනයෙන්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

එල්.ඩී.—ඕ. 7/2021

## 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2021 අංක    දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2021 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මකවීමේ දිනය

**2.** 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

2003 අංක 3 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

(අ) එම වගන්තියේ (ඉ) ඡේදයේ “සියයට දහයක්” යන වචන ඉවත් කර ඒ වෙනුවට “සියයට පහළොවක්” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) එම වගන්තියේ (ඊ) ඡේදයේ “2020 ජනවාරි මස 1 වන දිනයෙන්”, යන වචන සහ ඉලක්කම් ඉවත් කර ඒ වෙනුවට “2030 ජනවාරි මස 1 වන දිනයෙන්” යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව